මාධ්‍ය නිවේදනය

2018 පෙබරවාරි 13, කොළඹදී...

Nestlé
Good Food, Good Life

# නෙස්ලේ වෙතින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නියම පොල් සාරය සපිරි කිරි පානය *Nespray* Coco-Up නමින් හඳුන්වා දෙයි

දේශීය කිරි යහගුණයෙන් හා නැවුම් හා රසවත් පොල් රසයෙන් අනූන නව වට්ටෝරුවක්!

නෙස්ප්‍රේ කිරි ගුණයත් පොල්වල අඩංගු නැවුම් රසයත් මනාව ගලපමින් හඳුන්වාදෙනු ලැබූ *Nespray* Coco-Up යනු නෙස්ලේ සමාගමේ අලුත්ම Ready-to-Drink පානය යි. කිරි රසයත්, නැවුම් පොල් රසයත් සහිත *Nespray* Coco-Up නිපදවන්නේ දේශීය කිරි සහ පොල් යොදාගෙන ය. ඊට කිසිදු කෘත්‍රිම වර්ණකයක් හෝ ආහාර කල්තබාගැනීමේ ද්‍රව්‍යයක් එක් නොකෙරේ. තවද පොල් සාරය යොදා නිෂ්පාදනය කරන ලද මෙරට ප්‍රථම කිරි පානය වන්නේ ද මෙයයි. ගෝලීය මට්ටමින් ද නෙස්ලේ සමාගම මේ ආකාරයේ නිෂ්පාදනයක් සිදුකළ පළමු අවස්ථාවද මෙය වීම කැපීපෙනේ.

පොල් යනු ශ්‍රී ලංකාවේ මෙන්ම ලොව පුරාම ආහාර පිළියෙල කිරීමටත් පානය කිරීමටත් යොදාගන්නා සුවිශේෂී නැවුම් රසයක් සහිත ආහාරයකි. ස්වභාවයෙන්ම කැල්සියම් ගුණයෙන් අනූන කිරි, වර්ධනයට හා සංවර්ධනයට දරුවන්ගේ ආහාරවේලෙහි අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටුකරයි. මේ ප්‍රධාන ආහාර ද්‍රව්‍ය දෙක මනාව ගලපමින් තම කිරි සන්නාමය වන නෙස්ප්‍රේ යටතේ ළමුන්ට වඩාත් විනෝදයෙන් යුතුව කිරි පානය කිරීම සඳහා යොමුකරන මේ සුවිශේෂී පානය නෙස්ලේ හඳුන්වා දී තිබේ.

නෙස්ලේ සමාගමේ කිරි අංශයේ උප සභාපති රුවන් වැලිකල මහතා මෙසේ පැවසීය, "තම දරුවන්ට ශක්තිමත් පෝෂණීය පදනමක් ලබාදීමට උනන්දු සෑම මවක්ම නෙස්ප්‍රේ කෙරෙහි දැඩි විශ්වාසයක් තබා තිබෙනවා. දරුවන්ගේ විවිධ රුචිකත්වයන්ට හා අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට නෙස්ප්‍රේ, කිරි නිෂ්පාදන රැසක් හඳුන්වා දී තිබෙනවා. නැවුම් කිරි සහ පොල් නව වට්ටෝරුවෙන් නිෂ්පාදනය කරන *Nespray* Coco-Up අපගේ ශක්තිමත් නිෂ්පාදන පෙළට එකතු වීමත් සමග සුවිශේෂී අත්දැකීමක්, එනම් කිරි පානය කිරීමේ අලුත් වින්දනයක්, ත්‍රාසයක් වගේම නැවුම් බවක් දරුවන්ට ලබා දේ".

මෙම නව නිෂ්පාදනය, නෙස්ලේ සතු ලොව ප්‍රමුඛතම පර්යේෂණ හා සංවර්ධන (R&D) ඒකකය විසින් හඳුන්වා දෙනු ලැබූවකි. එමෙන්ම ළමා පෝෂණය ගැනත් කිරි හා පොල් සැකසීම පිළිබඳවත් නෙස්ලේ සමාගම සතු විශේෂඥතාවය ද මෙහිදී උපයෝගී වී ඇත. අලෙවි අගය අතින් නෙස්ලේ යනු ලොව විශාලතම කිරි සමාගමයි. එමෙන්ම දෛනිකව 20,000කට ආසන්න දේශීය කිරි ගොවීන් සංඛ්‍යාවකින් කිරි ලබාගන්නා නෙස්ලේ සමාගම, ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය නියෝජනය කරන විශාලතම කිරි රැස්කරන්නා ද වේ. දේශීය කිරි ආශ්‍රිත පාන වර්ග සඳහා වෙළෙඳපොළේ ප්‍රමුඛයා වන නෙස්ලේ, 1984 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ කිරි නිෂ්පාදනයේ යෙදී සිටී.

එමෙන්ම නෙස්ලේ යනු ලොව විශාලතම පිටිකළ පොල්කිරි අපනයනකරුවන් අතරින් එකකි. ඒ හරහා ද 6,000කට වැඩි දේශීය පොල් ගොවීන්ගේ ජීවනෝපායන් කෙරෙහි ධනාත්මක

බලපෑමක් ඇතිකෙරේ. නෙස්ලේ සමාගම සතු පොල් සැලසුම ඔස්සේ නව පොල් ගොවීන්ට මෙන්ම ගෘහස්ථ මට්ටමේ පොල් වගාකරන්නන්ට ද පොල් සාර්ථකව වගාකිරීමට සහාය හිමිවේ. කුරුණෑගල පිහිටි තම කර්මාන්තශාලාව තුළ 80 දශකයේ පටන් පිරිකළ පොල්කිරි නිෂ්පාදනයේ යෙදී සිටින නෙස්ලේ සමාගම, දේශීය පොල් පමණක් යොදාගෙන, මෙම නිෂ්පාදනය ලොව පුරා නෙස්ලේ වෙළෙඳපොළවල් කරා අපනයනය කරනු ලබයි.

නෙස්ලේ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ෂිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පැවසුවාය, "මීට වසර 150කට පෙර අප සමාගම ආරම්භ කළ දා පටන්, නව නිෂ්පාදන හඳුන්වාදීම අපේ ජානවල අඩංගු වූවක්. අද ජීවිතයේ ගුණාත්මක බව වැඩිදියුණු කළ හැකි ආකාරයේ නව්‍ය සහ විද්‍යාව පදනම් කරගත් නිෂ්පාදන හා සේවාවන් අපි දිගටම හඳුන්වාදෙමින් සිටිනවා. දේශීය නැවුම් කිරි වලින් සෑදූ විවිධ නිෂ්පාදන අපේ දේශීය පාරිභෝගිකයන්ට ලබාදීමට හැකිවීම ගැන අපි ආඩම්බර වෙනවා. සුවිශේෂී පොල් රසයෙන් යුතුව හඳුන්වාදුන් *Nespray* Coco-Up පානයත් ඒ අනුව අපි හඳුන්වාදුන් අලුත්ම නිෂ්පාදනයයි. අති නවීන ජාත්‍යන්තර තාක්ෂණය සමඟ පර්යේෂණ හා සංවර්ධන ඔස්සේ දේශීය වශයෙන් අලුත් නිෂ්පාදන හඳුන්වාදීමට ශ්‍රී ලංකාවේ පිහිටි නෙස්ලේ සමාගමේ ක්‍රියාකාරීත්වය මෙන්ම දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින් පාරිභෝගික රුචිකත්වයන්ට අනුව සුපිරි තත්ත්වයේ නිෂ්පාදන හඳුන්වා දීම මින් මනාව පිළිබිඹු වෙනවා".

ශීත කර භාවිතයට වඩාත් සුදුසු *Nespray* Coco-Up පානයේ මිල රුපියල් 60කි. දිවයින පුරා ප්‍රධාන සුපිරි වෙළෙඳසැල්වලදී එය ලබාගත හැක. *Nespray* Coco-Up යනු දේශීය කිරිවලින් නිෂ්පාදනය කෙරෙන *Nespray* Fortigrow, *Nespray* Everyday සහ *Nespray* Nutri-Up යන නෙස්ලේ නිෂ්පාදන පෙළේ අලුත්ම නිෂ්පාදනයයි.